ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2018/10/22 |

## 2018 සැප්තැම්බර් මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100) විචලනය මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත 2018 අගෝස්තු මාසයේ දී පැවැති සියයට 2.5 ට සාපේක්ෂව 2018 සැප්තැම්බර් මාසයේ දී සියයට 0.9 ක් දක්වා පහළ ගියේය. මෙම පහළ යෑම සඳහා පදනම් බලපෑම සහ ආහාර මිලෙහි වූ මාසික පහළ යෑම හේතු විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි දර්ශකයෙහි වෙනස 2018 අගෝස්තු මාසයේ දී වාර්තා වූ සියයට 4.7 සිට 2018 සැප්තැම්බර් මාසයේ දී සියයට 4.0 දක්වා පහළ ගියේය.

මාසික වෙනස්වීම සැලකූ විට, ජා.පා.මි.ද. 2018 අගෝස්තු මාසයේ වාර්තා වූ දර්ශක අංක 125.4 සිට 2018 සැප්තැම්බර් මාසයේ දී දර්ශක අංක 124.4 දක්වා පහළ යෑමට ආහාර කාණ්ඩයේ අයිතමවල මිලෙහි පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු වූ අතර ඒ සඳහා විශේෂයෙන් එළවළු, පොල්, අමු මිරිස් සහ නැවුම් මත්ස්‍ය අයත් වේ. මේ අතර, ආහාර නොවන කාණ්ඩය තුළ මිල ඉහළ යෑම් දක්නට ලැබුණු අතර විශේෂයෙන් මධ්‍යසාර පාන වර්ග සහ දුම්කොළ; ප්‍රවාහන; හා ආපනශාලා සහ හෝටල් උප කාණ්ඩ මේ සඳහා දායක විය.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි දර්ශකයෙහි මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2018 අගෝස්තු මාසයේ දී පැවති සියයට 2.7 හි සිට 2018 සැප්තැම්බර් මාසයේ දී සියයට 3.1 දක්වා ඉහළ ගියේය. මේ අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2018 අගෝස්තු මාසයේ දී වාර්තා වූ සියයට 2.5 හි සිට 2018 සැප්තැම්බර් මාසයේ දී සියයට 2.4 දක්වා පහළ ගියේය.



# ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

## පදනම : 2013 = 100

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි. ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2016 | ජනවාරි | 112.0 | 113.4 | -1.1 | 0.4 | -0.7 | 3.0 | 2.9 | 4.3 |
| | පෙබරවාරි | 110.8 | 113.9 | -1.1 | 0.4 | 1.7 | 4.6 | 2.6 | 4.4 |
| | මාර්තු | 110.0 | 114.3 | -0.7 | 0.4 | 2.2 | 5.0 | 2.4 | 4.5 |
| | අප්‍රේල් | 111.6 | 115.7 | 1.5 | 1.2 | 4.3 | 5.9 | 2.6 | 4.7 |
| | මැයි | 113.7 | 117.5 | 1.9 | 1.6 | 5.3 | 7.2 | 2.7 | 5.0 |
| | ජූනි | 116.1 | 118.2 | 2.1 | 0.6 | 6.4 | 7.5 | 3.1 | 5.3 |
| | ජූලි | 115.2 | 117.9 | -0.8 | -0.3 | 5.8 | 6.8 | 3.4 | 5.5 |
| | අගෝස්තු | 113.3 | 117.4 | -1.6 | -0.4 | 4.5 | 6.0 | 3.6 | 5.6 |
| | සැප්තැම්බර් | 113.5 | 117.7 | 0.2 | 0.3 | 4.7 | 5.7 | 3.8 | 5.7 |
| | ඔක්තෝබර් | 114.7 | 118.2 | 1.1 | 0.4 | 5.0 | 5.7 | 4.0 | 5.7 |
| | නොවැම්බර් | 116.6 | 120.4 | 1.7 | 1.9 | 4.1 | 6.8 | 4.0 | 5.8 |
| | දෙසැම්බර් | 118.0 | 120.5 | 1.2 | 0.1 | 4.2 | 6.7 | 4.0 | 5.9 |
| 2017 | ජනවාරි | 119.3 | 121.4 | 1.1 | 0.7 | 6.5 | 7.1 | 4.6 | 6.2 |
| | පෙබරවාරි | 119.9 | 122.0 | 0.5 | 0.5 | 8.2 | 7.1 | 5.1 | 6.4 |
| | මාර්තු | 119.5 | 122.3 | -0.3 | 0.2 | 8.6 | 7.0 | 5.6 | 6.6 |
| | අප්‍රේල් | 121.0 | 122.5 | 1.3 | 0.2 | 8.4 | 5.9 | 6.0 | 6.6 |
| | මැයි | 121.8 | 123.0 | 0.7 | 0.4 | 7.1 | 4.7 | 6.1 | 6.4 |
| | ජූනි | 123.4 | 123.1 | 1.3 | 0.1 | 6.3 | 4.1 | 6.1 | 6.1 |
| | ජූලි | 122.4 | 122.9 | -0.8 | -0.2 | 6.3 | 4.2 | 6.2 | 5.9 |
| | අගෝස්තු | 122.3 | 123.0 | -0.1 | 0.1 | 7.9 | 4.8 | 6.5 | 5.8 |
| | සැප්තැම්බර් | 123.3 | 123.1 | 0.8 | 0.1 | 8.6 | 4.6 | 6.8 | 5.7 |
| | ඔක්තෝබර් | 124.8 | 123.1 | 1.2 | 0.0 | 8.8 | 4.1 | 7.1 | 5.6 |
| | නොවැම්බර් | 126.4 | 123.8 | 1.3 | 0.6 | 8.4 | 2.8 | 7.5 | 5.2 |
| | දෙසැම්බර් | 126.6 | 123.8 | 0.2 | 0.0 | 7.3 | 2.7 | 7.7 | 4.9 |
| 2018 | ජනවාරි | 125.8 | 123.9 | -0.6 | 0.1 | 5.4 | 2.1 | 7.6 | 4.5 |
| | පෙබරවාරි | 123.7 | 124.4 | -1.7 | 0.4 | 3.2 | 2.0 | 7.2 | 4.1 |
| | මාර්තු | 122.8 | 124.6 | -0.7 | 0.2 | 2.8 | 1.9 | 6.7 | 3.6 |
| | අප්‍රේල් | 122.9 | 124.8 | 0.1 | 0.2 | 1.6 | 1.9 | 6.1 | 3.3 |
| | මැයි | 124.3 | 125.1 | 1.1 | 0.2 | 2.1 | 1.7 | 5.7 | 3.1 |
| | ජූනි | 126.5 | 125.3 | 1.8 | 0.2 | 2.5 | 1.8 | 5.3 | 2.9 |
| | ජූලි | 126.6 | 125.7 | 0.1 | 0.3 | 3.4 | 2.3 | 5.1 | 2.7 |
| | අගෝස්තු | 125.4 | 126.3 | -0.9 | 0.5 | 2.5 | 2.7 | 4.7 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | 126.9 | -0.8 | 0.5 | 0.9 | 3.1 | 4.0 | 2.4 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව